ශ්‍රී ලංකාවේ සාහිත්‍යධරයන් අමතා ලියමි

දන්නා නොදන්නා පුද්ගලයෙන් බොහෝ දෙනකු නමින්ම සඳහන් කරමින් ලියන මේ ලිපිය මෙරට වසන ලේඛක ලේඛිකාවන් කුපිත නොකරන බව මට විශ්වාස ය. මව්බිමේ වසන මා දන්නා දෙතුන් දෙනකුන් නොදන්නා සමහරකුත් මා කියන දේ නුරුස්සන්නට ඉඩ ඇත. මා ලියන්නේ ඒ බව දැන දැන ම ය.

අප වසන මේ මහාද්වීපය තුළ සිංහල ලේඛකයන් වශයෙන් සැලකිය යුතු ගැහැනු පිරිමි දෙපක්ෂයටම අයත් පිරිසක් සිටින බව ශ්‍රී ලංකාවේ සිටින විද්වත්තු දනිති. දන්නවා කීවාට අසා තිබීම පමණක් නොසෑහෙන බවත් ඒ පුද්ගලයන් ලියන කියන දේ කෙරෙහි අවධානය යොමු කළ යුතු බවත් අවධාරණය කිරීම මේ ලිපියේ එක් අරමුණකි.

මම සාහිත්‍යධර ගණයට ඇතුළත් නොවෙමි. මා දන්නා තරමින් ඒ ගණයට ගත හැකි එකම පුද්ගලයා වූ කා. හරිස්චන්ද්‍ර දැනට වසර චොළහකටත් පෙර මිය ගියේ ය. තවත් අය සිටින්නට ඇතත් මම ඔවුන් ගැන නොදනිමි. මා පොත් සැළකිය යුතු සංඛ්‍යාවක් ලියුවෙක්මි. එහෙත් අර කියපු තත්වයට යාමට තරම් ගැඹුරු සාහිත්‍යාවබෝධයක් මට නැත. මම ඒබව පිළිගනිමි.

අනෙක් අතට සාහිත්‍යධරයා පවා බුදු බව ලැබුවකු නොවන බවත් මම දනිමි. ඒ කියන්නේ ඔවුන්ගේ දුබලතා සහ ඔවුන් නොදන්නා දේ කොතෙකුත් තිබිය හැකි බවය.

පළමුකොට මෙරට වාසය කරන අපේ ලේඛකයන් හා ඔවුන්ගේ කෘති සමහරක් සඳහන් කරමි.

සංස්කරණයෙන් පළ කරන ලදී .

සිඩ්නිවාසීන් අතර සඳහන් කළ යුතු අනෙක් ලේඛකයා නිමල් ප්‍රනාන්දු ය. "සම්මාන සංදාම" නමින් නොබෙල් ත්‍යාගලාභී ලේඛකයන්ගේ කෙටි කතා සංග්‍රහ දෙකක් පළ කළ ඔහු "සත් කුළු පව්" නමින් තමාගේම නිර්මාණයක් ද පළ කර ඇත.

ආචාර්ය උබයසිරි විජයානන්ද චිත්‍රක කැළණි සරසවිය හා ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂෙත්‍රය අළලා සිංහලෙන් හා ඉංගිරිසියෙන් සංක්ෂිප්ත විග්‍රහ දෙකක් පළ කර ඇත .

කැන්බරා නුවරින් අපට හමුවන පී පියසේන (පට්ටිඇආරච්චි) "රටකින් එහා" නමින් කෙටි කතා සංග්‍රහයක් පළ කළේ ය. "හිරුට මුවාවෙන්" යනුවෙන් කෙටිකතා සහ කවි එකතුවක් පළ කළ රෝහිනී ප්‍රමිතා ගුණරත්න පසුව රෙබෙකා නම් ඉංගිරිසි නවකතාව සිංහලට නගා පළ කරවූවා ය.ආචාර්ය විජ්‍යනි මනතුංග ලියූ හිම බිමේ සුදු රෝස නම් නවකතාව මෑතක පළ කරන ලදී .

පර්ත් නගරයෙන් අපට හමුවන ලේඛකයා සිංහල ඉංගිරිසි දෙබසින්ම ලියන්නෙකි. ඔහු ලියූ මතක දිවයින කවි සංග්‍රහයකි. ඉන් පසු තවත් කවි එකතුවක් පළ කළ සුනිල් ගෝවින්න කලු හංසයෝ සහ වෙනත් කතා නමින් ඉංගිරිසි කෙටි කතා එකතුවක්ද ලියා ඇත. ඔහු ලියූ ඉංගිරිසි නවකතාවක් සිලෝන් ඩේලි නිවිස් පත්තරයේ කොටස් වශයෙන් පළවූ බව දනිමි.

මෙරට ලියැවුණු දෙවැනි සිංහල පොත වන ලංකාවක් වගේ පුංචි

මෙරට සිට ලියන ලිපියක් ශ්‍රී ලංකාවේ පත්තරයක පළකරවා ගැනීම පහසු නැත . මා ලියූ ලිපි කිහිපයක්ම එසේ ඉවත ලන ලදී . දැන් මම ඒ මෝඩ කම නොකරමි. පුදුම සහගත වුවත් ඇත්ත කතාව නම් මගේ ලිපි කිහිපයක් පළ කිරීමේ ගෞරවය දීමට මට සිදුවන්නේ කිසි දිනෙක මුන නොගැසුණ මගේ හිතවතා වූ අජිත් සමරනායකටය.

මා දන්නා අනෙක් පත්තරකාරයා ලංකාදීප සංස-'කාරක සිරි රණසිංහ ය. 2001 දී පමණ මම මගේ පොත් හතරක් හෝ පහක් අරගෙන ඔහු වෙත ගියේ ඒ පොත් ගැන ලියවාගනු පිණිස ය. සිරි රණසිංහ මා සමග පොත්ද රැගෙන ගොස් ලංකාදීප විශේෂාංග කතුවරියට බාර කළේ ය. මට අදගේ නම මතක නැත . මා හඳුනන කාන්තාවක වූ ඇය මට කීවේ පොත් ගැන ලියන තරුණයා එදින නොසිටි හෙයින් මා හමුවී සාකච්ඡා කිරීමට ඔහුට දැන්වන බවය. ඒ කියන තරුණයා සමුළු වෙත්තසිංහ ය. සමුළු මට දුරකතන ඇමතුමක් දී තමා හමුවන්නට එන ලෙස දැන්වීය. මම ලංකාදීප කාර්යාලයට ගොස් ඔහු මුණ ගැසුනෙමි. පැය බාගයක් පමණ මා සමග සාකච්ඡා කළාට පසු මා පිට වූයේ ඔහුගෙන් මේ ඉල්ලීමඳ කරලාය.

"මේ පොත් කියවලා බලා ලියන්න"

මා එදා දුන් පොත් සියල්ලම ඔහු ලඟ තිබුණේ ය.

මා මෙහිදී ලියූ ලංකාවක් වගේ පුංචි පටන් 2003 ද්වාවා ලියූ හැම පොතක්ම ඔහුට දීන බව මතකය. ඔහු සරසවියේ කතුකම නරඳ්දී පිතු පාදං ගැන කෙටි විචාරයක් පළ කළ වගඳ මට මතකය. ඒ හැර අන් එකදු පොතක් ගැන වචනයක් ඔහු යටතේ පැවති පත්තරයක පළවූයේ නැත .

202 අග දී පැවැත්වුණ මගේ පොත් එළිදැක්වීම ගැන ගාමිණී ෆොන්සේකා ලියූ ලිපියක්ද රැගෙන මම ඒ වසර අගදීම ලේකහවුස් ආයතනයට ගියේ දයා ලංකාපුර හමු වී ඔහුට ඒ ලිපිය බාර දෙනු පිණිසය. 1998 දී මගේ ලංකාවක් වගේ පුංචි එළි දැක්වීම ගැන ගාමිණී ලියූ විචාරයක්

ඕස්ට්‍රේලියාවේ පළමු සිංහල පොත වන "සමනළ දූතය" නම් සංදේශ කාව්‍යය ලියූ සිඩ්නිවාසී හෙන්රි කුමාරප්පෙරුම එය පළ කළේ 1995 දී ය. ඉන්පසු " ගම්සරණිය" නමින් නවකතාවක් ලියූ හෙන්රි මෑතක තවත් නවකතාවක් සහ පරිවර්තනයක් ඇතුළු පොත් කිහිපයක්ම ලියා ඇත.

නවකතා වැඩි ගණනක් ලියූ ලේඛකයා සමන් මහා-නාම දිසානායක ය. වෘත්තියෙන් ඉංජිනේරුවකු වන ඔහුගේ පළමු නවකතාව වන "බඹරැන්දේ කගවේනා" පළ කරන ලද්දේ 2000 දී ය. රන්දෙණිගල වළව්ව සිහින කුමාරි ලංසි කෙල්ල ආදී අනෙක් නවකතාද ශ්‍රී ලංකාවේ පළ කරන ලද බවද කිව යුතු ය. සුප්‍රකට පුවත්පත් කලාවේදියකුව සිටි මහානාම දිසානායක සමන්ගේ පියා බව මෙරට රසිකයන් පවා දන්නේ නැත.

රුසියන් බස හදාළ ආචාර්ය පාලිත ගනේවත්ත තවත් සිඩ්නිවාසී ලේඛකයෙකි. "ලේ හුරු සුවඳ" නමින් කෙටිකතා එකතුවක් පළ කළ පාලිත ඉන්පසු " බොඳ වූ ලොව" සහ "ඇසි පිය" නම් වූ කවි පොත් දෙකක් ලියා ඇත . ඔහු ලියූ නවකතා දෙක "ඇවිත් නොරටක" සහ "මාවත අඹියස" නමින් පළ විය. " චෙකොෆ් සියවසකට පසු" කමින් චෙකෝෆ් කෙටි කතා ගණනාවක් මුලු රුසියන් බසින්ම සිංහලට නගා පළ කළ ඔහු මෑතක "දොස්තර චෙකොෆ්" නමින් ඒ ලේඛකයාගේ වෘත්තිය ඔහුගේ ලේඛණ කලාවට බලපා ඇති ආකාරය පැහැදිලි කළේ ය. ගුණදාස අමරසේකර සමග සංවාද නමින් ඔහු විසින් මෙරට ප්‍රධාන ගුවන් විදුලි සේවාවක් වන එස්බීඑස් සිංහල සේවයට ගුණදාස සමග කරන ලද සාකච්ඡා පොතක් වශයෙන් පළ කළේ ය.

රසික සූරියආරච්චි ද වෘත්තියෙන් ඉංජිනේරුවෙකි. මෙරට ලේඛකයන්ගේ කෙටිකතා එකතුවක් "තිරස සරණ" නමින් සංස්කරණය කරන ලද්දේ ඔහු විසින් ය. තමාගේම කවි ඇතුළත් "සිව් සිත් කව්" නමින් සංග්‍රහය සහ "සිව් වසරක් මරදානේ" ද ඔහුගේ කෘති අතරට ගැනෙයි. විවිධ කවීන්ගේ රචනා එකතුවක් ද (දකුණු කුරු දිව් කව්) ඔහුගේ

නම් මගේ කෙටි කතා එකතුව පළ වූයේ 1998 දී ය. ඉන්පසු මම සිංහල සහ ඉංගිරිසි පොත් හතළිහකට අධික සංඛ්‍යාවක් ලියා පළ කළෙමි.

ගිය වසරේ මා මුණ ගැහෙන්නට පැමිණි මගේ පරණ සගයකු හා සම්මානලාභී නවකතාකරුවකු වන සේන තෝරදෙනිය දැන සිටියේ මගේ සිරගෙයි දිග පොත හා අර්බත් දරුවෝ යන පරිවර්තන දෙක පමණකි. අර්බත් දරුවෝ ගැන අසා තිබුණා පමණි.

ඒ බව තහවුරු වූයේ අපසු සිය රට බලා ගොස් මගේ මිත්‍ර නිමල් දිසානායකගෙන් මගේ පොත් ගණනාවක් ලබාගත් විටය. අර්බත් දරුවෝ කාණ්ඩ 7 දැක ඔහු කීවේ මෙයයි.

"මේ ඔක්කොම කියවන්න එපායැ"

ඔහුගේ මුවින් පිටවූයේ නොදැනීම වාගේ ය. නිතිපතා පත්තරයට ලියන ප්‍රවීණ ලේඛකයකු වූ සේන එහෙම කියනවා නම් අනෙකුත් පත්තරකාරයන් පොත් ගැන දරන ආකල්ප හිතා ගැනීම පහසුය. ඒ පොතම (කාණ්ඩ හතකින් යුක්තය) වෙනත් පත්තරකාරයකුට දුන්නත් ඒ ගැන නොලියවුණේ ද ඒ අපහසුව නොහොත් අකැමැත්ත නිසා බව මම අනුමාන කරමි. සේන වෘත්තිය පත්තරකතාරයකු නොවේ. අනෙක් පුද්ගලයා වෘත්තිකයෙක්. එබඳු අයට හිතරම හදිසියේ කළ යුතු වාර්තා හා ලිපි ගැන සිත යොමු කිරීමට සිදුවෙයි.

මා පත්තරකාරයන්ට පොත් පිරිනැමීම අත්හැර දැමුවේ ඔය වාගේ අත්දැකීම් කිහිපයක් නිසාය. ඒ ටික කියන විට මට ඔවුන්ගේ නම්ද සඳහන් කිරීමට සිදුවෙයි.

පළමු කොට මා වැඩිම කාලයක් දැන සිටි නිලකරත්න කුරුවිටබණ්ඩාර ගැන කිව යුතු ය. මා ඔහු හඳුනාගත්තේ නුමේගොඩ ශාන්ත ජෝන් විදුහලේ උගන්නා නිලකරත්න සිල්වා හැටියට ය. පුංචි අවදියේ ය. ලේක්හවුස් ආයතනයට බැඳී කුරුවිට බණ්ඩාර නම භාවිතයට පටන් ගත් පසුද මට ඔහු හිතර හමුවී ඇත. වරක් දෙකක් ඔහුගේ ඇරැයුමෙන් දිනමිණට ලිපි ද ලියූවෙමි. නිලකරත්න පසුව මව්බිම කතුවරයා වූ විට මා මෙහි සිට ලියූ ලිපි කිහිපයක් එහි පළ කරවිය. ඉන් එකක් " ලබ ධාතුවේ බල මහිමය" මගේ "පිරිමි ජාතිය උතුම් ජාතිය" ලිපි එකතුවට ඇතුළත් කර ඇත .

මා එසේ කීවේ පොත් දෙසට ඇඟිල්ල දික්කරලා ය.

සමුළු වෙත්තසිංහ ලියූ ලිපියක් පසුදාක ලංකාදීපයේ පළවිය. පිටු බාගයක පමණ දියටය. ලිපිය මා ගැනය. පොතක් ගැන වචනයක් නැත . පොතක නමක් පවා නැත . ඔහු එක පොතක් වත් කියවූවා නම් නමක් සඳහන් කරන්නට ඉඩ තිබුණා යයි සිතමි.

සිරි රණසිංහගේ කතාව එතැනින් ඉවර නැත . 2005 දී මගේ අර්ධනාරි පළ වූ පසු එය මුද්‍රණය කළ පියසිරි මුද්‍රණාලයේ සිටි මගේ මිතුරෙක් පොත ගැන ලියවා ගනිමු යයි කියා තමා දන්නා කතුවරයකුට කතා කළේ ය. ලැබුණ පිළිතුරද මට කීවේ ය.

"අපි එයා ගැන කලින් ලිව්වනෙ"

පිළිතුර දුන්නේ යට කී සිරි රණසිංහ ය. මට පුදුම සිතුනේ මේ පළපුරුදු පත්තරකාරයා පවා පොතක් ලියන මනුස්සයාට වුවමනා තමා ලියූ පොත ගැන ලියවා ගන්වමුත් පුද්ගල වර්ණනාවක් නොවන බව නොදැන සිටීම ගැන ය. සිව් වසරකට පෙර ලියූ ලිපිය ගැන මහ ලොකුවට කතා කරපු පුද්ගලයා එදා පවා මගේ පොතක් ගැන වචනයක් පළ නොලබ බව දැන සිටිය යුතුය.

ඔන්න පළපුරුදු පත්තරකාරයන්ගේ සාහිත්‍ය විචාරය.

කුරුවිටබණ්ඩාර ගැන තවත් කිව යුතුය. මා ලියූ නරා වළ සහ කළු හිල සහ විප්ලවය ආවොත් යන කෙටි කතා පොත් දෙකම අරන් මම ඔහුගේ ගෙදරටම ගොස් අතින්ම දුන්නෙමි. ඊට කලින් මගේ හැන්දෑවට පායන හිරු ද එසේම දුන් පසු එයින් පරිච්ඡේද දෙකක්ම උපුටා මව්බිම පත්තරයේ පළ කළේ ය. ඒ වන විට ඔහු එහි කතුවරයා විය.

ඡායාරූපයක්ද සමග සිළුමිණ පත්තරයේ පළවිය. ඒ දුටු නිසා මම ගාමිණීගෙන් අසාගෙන කලින් ලිපිය පළ කරවූ පුද්ගලයා සොයා ගෙන ගියෙමි.

දයා මුණ ගැසෙන්නට කලින් මට හමුවූයේ නියෝජ්‍ය සංස්කාරක කුරුවිට බණ්ඩාර ය. මා ඇදගෙන කාමරයට එක්කන් ගිය ඔහු මාගේත් අප දෙදෙනාගෙන් ඡායාරූප කිහිපයක් ගන්නට සළස්වා මා බාර කළේ ඉනෝකා සමරවික්‍රම නමැති ලේඛිකාවටය. මා සමග කතා කොට ලිපියක් සකස් කිරීමටය. මා සමග පැය බාගයක් පමණ සාකච්ඡා කළ ඉනෝකා ලිපිය ලියා බාරදුන් බවඳ මම දැන ගතිමි. ඒ කියන ලිපිය හෝ ඡායාරූප පළ වූයේ නැත . ඒ තබා මා දයාට දෙන්නට අරන් ගිය ලිපිය අරගත් කුරුවිටබණ්ඩාර එයත් කුණුකූඩයට විසි කර තිබිණ. ගාමිණී ගේ ලක්හඬ ගුවන් විදුලිය ගැන කෙටි විස්තරයක් (මා ලියූ) පමණක් පළ කරන ලදී .

කොට කලිසම ඇඳපු කාලයේ ඉඳන් මා හඳුනන මේ මහා පුවත්පත් කලාවේදියාගෙන් මම පුද්ගලික උදව්වක් නොඉල්ලීමි. සාමාන්‍ය පුවත්පත් කලාවේදියකුගේ බලාපොරොත්තු විය යුතු ආකාරයට මගේ පොත් ගැන විවේචන පමණි. වර්ණනා ද නොවේ. මගේ පිතුපාදං හැර අන් එනඳු පොතක් ඔහුගේ අවදානයට ගොදුරු වූයේ නැත .

අඳත් ඔහු මගේ හිතවතෙකි. පුවත්පත් කලාකරු-වකු ලෙසින් මගෙන් ඔහුට ලකුණු ලැබෙන්නේ නැත.

2001 දීම රාවය කතුවර වික්ටර් අයිවන් මුණ ගැසී පොත් දුන්නාටත් වැඩක් නොවූ බව සඳහන් කරන්නේ පසුතැවීමකින් නොවේ. මම ඔහුගේ ප්‍රතිචාරයක් නොපැතුවෙමි.

රාත්‍රියේ ගෙදරට ටෙලිෆෝන් කර පසුදා

VCE Chemistry 2013

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited
Priyantha Liyanage
0407664546